සී/ස  කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ් - 2022/2023

---------------------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සී/ස  කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ්හි (“සමාගම”) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ  විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින්  2023 මාර්තු 31 දිනට  මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්  විගණකගේ වගකීම යන  කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,**

- **ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.**

- **අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.**

- **භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.**

- **සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.**

- **මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.**
  **හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.**

- **තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;**

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.5.1** ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 - 2020 කාලපරිච්ඡේදයේදී ප්‍රධාන කාර්යාලය පැවති පැලවත්තේ පෞද්ගලික ගොඩනැගිල්ල මාසික කුලී පදනම මත ලබාගැනීමේදී, ගෙවන ලද රු.1,440,000 ක තැන්පතු මුදල ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ලෙහි වෙනත් පෞද්ගලික ගොඩනැගිල්ලකට ගෙන ගියද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි. | සමාගම විසින් කඩුවෙල දිසා අධිකරණයේ ගොඩනැගිලි අයිතිකරුට විරුද්ධව නඩුවක් ගොනු කර ඇත. | නොපමාව අදාළ තැන්පතු මුදල අයකර ගත යුතුය. |
| (ආ) | හිනිදුම හිල්ස් කර්මාන්තශාලාවෙහි වර්ෂ 04 කට වැඩි කාලයක සිට පැවත එන, අමු දලු සැපයුම්කරුවන් සඳහා ලබා දී ඇති රු.536,185 ක අත්තිකාරම් ශේෂයන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර ගෙන නොතිබුණි. | හිනිදුම හිල්ස් දලු සැපයුම්කරුවන්ට ලබා දුන් අත්තිකාරම් මුදල් වලින් ආයතනයට අයවියයුතු ශේෂයෙන් රු.373,597 ක මුදලක් ප්‍රවාහන නියෝජිතයින් තිදෙනෙකුට අයත් වන බැවින් ඔවුන් සඳහා සමථ මණ්ඩල පනත අනුව සමතයකට පත් නොවීමේ සහතිකයද සමඟ ඔවුනට අදාළ නඩු පැවරීමේ කටයුතු සිදු කර ඇත. ඉතිරි මුදල දලු වලින් සහ මුදල් මඟින් කර්මාන්තශාලා වෙත ගෙවෙමින් පවතී. | අදාළ අත්තිකාරම් මුදල් කඩිනමින් අයකරගැනීමට හෝ ඒ සඳහා දලු සැපයුම්කරුවන්ගෙන් තේ දලු ලබාගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2003 වර්ෂයේදී රාජ්‍ය සමාගමකට රු.10,000,000 ක ණය මුදලක් සියයට 22 ක පොලී අනුපාතිකයක් මත වාරික 12 කින් අයකර ගැනීමේ පදනම මත ලබා දී තිබුණු අතර, මුල් මුදල 2022 ජුනි මස 22 වන දින ආපසු ගෙවනු ලැබුවද සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.51,574,327 ක පොලිය 2023 මාර්තු 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | පොලී මුදල 2023 සැප්තැම්බර් 20 දිනට ප්‍රථම පිළිගත හැකි වාරික ගණනකින් ගෙවා නිම කරන ලෙසත් එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් 2022 ජුනි 23 දින අප සමාගම වෙත ලබා දුන් රු.මිලියන 10ක මුදල එදිනට ණය මුදලේ හා පොලී මුදලේ වටිනාකමේ ප්‍රතිශතයෙන්ම ගණනය කර පොලී මුදලේ කොටසක් අයකර ගන්නා බව 2023 ජුනි 21 දිනැති ලිපිය මඟින් BCC ආයතනය වෙත දන්වා ඇත. | ගිවිසුම් ප්‍රකාරව පොලී මුදල අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති , රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ඡේදය | සමාගමේ මානව සම්පත් කළමනාකරණය ඇතුළු මෙහෙයුම් ක්‍රියාවලිය හා පාලනයන් පිළිබඳව මෙහෙයුම් අත්පොතක් සකස් කර අවශ්‍ය අනුමැතීන් ලබාගෙන නොතිබුණි. | මානව සම්පත් කළමණාකරණය ඇතුළු මෙහෙයුම් ක්‍රියාවලිය හා පාලනය පිළිබඳව කෙටුම්පත් මෙහෙයුම් අත්පොත සකස් කර 2023 මැයි මාසයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. 2023 අගෝස්තු 30 දින මෙම අත්පොත සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. | මෙහෙයුම් අත්පොත අනුමත කර ගැනීම හා ඒ අනුව පරිපාලන කටයුතු සිදුකිරීම කඩිනම් කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු.220,800,775 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු ශුද්ධ අලාභය රු.7,298,752 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.228,099,527 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂය හා සැසඳීමේදී නිමි තේ විකුණුම් ආදායම රු.1,594,280,430 කින් ඉහළයාම හා කසළ තේ විකුණුම් ආදායම රු.15,312,553 කින් ඉහළයාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාගමේ විකුණුම් ආදායම සියයට 153 කින් වැඩි වී ඇති අතර මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ විකුණුම් ආදායම රු.1,306,037,232 කින් ඉහළ යාම බලපා ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම ස්ථාවර තැන්පතු පොලී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ආදායම් සියයට 132 කින් ඉහළ ගොස් ඇත. වියදම් සංරචක විශ්ලේෂණයේදී විකුණුම් පිරිවැය ඇතුළු අනෙකුත් ප්‍රධාන වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය වේ.

**2.3 අනුපාත විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් පිළිවෙලින් **4 : 1** ක් හා **2 : 1** වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් **2:1** ක් හා **1:1** වී තිබුණි. **2022/2023** වර්ෂයන්හි තොගය,කෙටිකාලීන ආයෝජන සහ මුදල්, මුදල් සමාන දෑ හී එකතුව රු.**603,889,226** ක් වී තිබීම, එනම් අධිකාරක ප්‍රාග්ධන තත්ත්වයක් හේතුවෙන් මෙම අනුපාතයන් ප්‍රශස්ත මට්ටමට වඩා ඉහළ අගයක් ගෙන තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව පිහිටි රු.**23,000,000** කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණු හෙක්ටයර් **4.075** ක් වූ ඉඩමෙහි, **1989** හා **1996** කාලයේ සිට අනවසර පදිංචිකරුවන් **15** දෙනෙකු පදිංචි වී සිටින අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ගැටලුව නිරවුල් කරගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි. | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව පිහිටි සම්පූර්ණ ඉඩම මැනීම සඳහා උපදෙස් ලබා දෙන ලෙසට ඉල්ලීමක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හරහා පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. | නීත්‍යානුකූල හිමිකම් පරීක්ෂාවෙන් අනතුරුව නීතිමය ක්‍රියාමාර්ග මඟින් ඉඩමේ අයිතිය නිරවුල් කර ගත යුතුය. |
| (ආ) | තේ ශක්ති අරමුදල යටතේ ආරම්භ කරන ලද හිනිදුම හිල්ස් හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලා පිළිවෙලින් **2012** සහ **2015** වර්ෂයන්හිදී කළුබෝවිටියාන ටී ෆැක්ටරි ලිමිටඩ් වෙත මෙහෙයුම් කටයුතු සඳහා පවරා දෙනු ලැබූ අතර සමාගම විසින් තේ ශක්ති අරමුදල වෙත **2015** අප්‍රේල් **09** දින රු. මිලියන **50** ක ණය මුදලක්ද ලබා දී තිබුණි. **2019** මාර්තු **19** දිනැති අංක අමප/**19/0743/117/024** දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම මුදල සහ අදාළ පොලිය වෙනුවෙන් හිනිදුම හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලාවල අයිතිය නීත්‍යානුකූලව සමාගම වෙත පවරාගැනීමට අනුමැතිය ලැබී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම කර්මාන්තශාලාවන්හි නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි. | මැණික්දිවෙල කර්මාන්තශාලාව පිහිටි ඉඩම අත්පත් කර ගැනීමේ අරමුණ සංශෝධනයකින් තොරව පවරා ගැනීම සඳහා අනුමැතිය ලැබී ඇති අතර යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සමාගම වෙත බදු පදනම මත ලබාදීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. හිනිදුම කර්මාන්තශාලාවට අයත් ඉඩම සමාගම වෙත බදු පදනම මත ලබා දීම සඳහා **2019** වර්ෂයට අදාළ තක්සේරුව ලබා ගැනීම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සිදු කරන අතර එය ලබා ගත් වහාම අප ආයතනය වෙත බදු පදනම මත ලබා දීමට කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව තේ කර්මාන්තශාලා වල අයිතිය සමාගමට පවරාගැනීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන තුළ රු.**1,400,000** ක වටිනාකමකට ගිණුම්ගත කර තිබුණු කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ කර්මාන්තශාලා නිලධාරී නිල නිවාසය, **2022** ජුනි **15** සිට ජූලි **15** දක්වා කාලය තුළදී නවීකරණය කිරීමට රු.**1,950,000** ක මුදලක් | **2023/24** මූල්‍ය වර්ෂය තුළදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර මේ වන විට ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලංසු තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් සිදුකරමින් පවතින අතර ඉදිරි මාසය ඇතුළත ප්‍රසම්පාදන කටයුතු අවසන් කර | නඩත්තු හා අලුත්වැඩියා කටයුතු කලට වේලාවට සිදුකිරීම තුළින් වත්කම් ආරක්ෂා කර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තු ගතකර තිබුණද 2023 ජූලි 25 විගණන දින වන විටත් එහි කටයුතු ආරම්භ කර නොතිබුණු අතර භාවිතයට ගත නොහැකි ආකාරයට අබලන්ව පැවතුණු මෙම නිල නිවාසය කඩිනමින් අලුත්වැඩියා නොකළ හොත් වැඩි පිරිවැයක් දැරීමට සමාගමට සිදුවන බවද විගණනයේදී නිරීක්ෂණය විය. | සුදුසු ලංසුකරු වෙත ප්‍රදානය කිරීමට කටයුතු කරනු ඇත. | |
| (ඇ) | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවෙහි වතුර පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2021 ජුනි 23 දින රු. 534,200 කට පුද්ගලික සැපයුම්කරුවකුට ලංසුව පිරිනමා අදාළ සිවිල් කාර්යයන් සඳහා 2023 මාර්තු 31 දින වන විට සමාගම විසින් රු.336,236 ක් වැය කර තිබුණු නමුත් 2023 ජූලි 25 විගණන දින වන විටත් සැපයුම්කරු විසින් මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ගණන් සීඝ්‍රවශයෙන් ඉහළ ගොස් පැවති බැවින් ලංසු මිල ගණන් යටතේ කාර්ය සම්පූර්ණ කිරීමට නොහැකි බව ලංසුකරු විසින් දන්වා ඇත. ලබා දුන් අත්තිකාරම් මුදල් 2023 අගෝස්තු 24 දින අප සමාගම වෙත නැවත අයකර ගෙන ඇති අතර නැවතත් ලංසු කැඳවා වතුර පිරිපහදුවට අදාළ ප්‍රසම්පාදන කාර්ය 2023/24 මූල්‍ය වර්ෂයේ 03 වන කාර්තුව තුළ නිම කිරීමට අපේක්ෂා කර ඇත. | කඩිනමින් වතුර පිරිපහදු පද්ධතිය ස්ථාපිත කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කර්මාන්තශාලා නව තාක්ෂණයට අනුවර්තනය කිරීම සඳහා රජයේ ප්‍රදාන වශයෙන් 2021 සැප්තැම්බර් 15 දින රු.18,204,900 ක ප්‍රදාන සමාගම වෙත ලබා දී තිබුණි. මේ යටතේ අනුමැතිය හිමිව තිබුණු ප්‍රසම්පාදන කාර්යයන් අතරින් දැරංගල හා හිනිදුම කර්මාන්තශාලාවන්හි දලු ඇඹරුම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සඳහා නව තාක්ෂණයෙන් යුත් යන්ත්‍ර සවිකර ස්වයංක්‍රීයකරණය කිරීමේ ව්‍යාපෘතියෙහි කටයුතු අවසන් කර තිබුණු අතර ඒ සඳහා වැය කරන ලද පිරිවැය රු.10,348,000 ක් විය. අනෙකුත් කාර්යයන් වන CTC කටර් මුවහත් කිරීම සඳහා පරිගණකගත තාක්ෂණය හඳුන්වාදීම සහ CTC තේ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම හා ස්ථාපිත කිරීමේ කටයුතු 2023 මාර්තු 31 වන විටත් ආරම්භ කර නොතිබුණු අතර රු.7,856,900 ක ප්‍රදාන ඉතිරිව පවතින බව නිරීක්ෂණය විය. | සීටීසී කටර් මුවහත් කිරීම සඳහා පරිගණක තාක්ෂණය හඳුන්වාදීම සඳහා මිල ගණන් කැඳවන ලද අතර සැපයුම්කරුවන් දෙදෙනෙකු විසින් මිළ ගණන් ඉදිරිපත් කළද ඇස්තමේන්තුගත මුදලට වඩා ලංසු මිල ඉතා ඉහළ අගයක් ගනු ලැබූ බැවින් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් සංශෝධනයක් සඳහා ඉල්ලීමක් කළද ඒ සඳහා එකඟතාවයක් නොදැක්වූ බැවින් ප්‍රසම්පාදන කමිටුව විසින් ඇස්තමේන්තුගත මුදල ඉහළ නංවා නැවත 2022/2023 වර්ෂයේ මිල ගණන් කැඳවන ලෙසට අනුමැතිය ලබා දී ඇත.<br><br>සීටීසී තේ ශ්‍රේණිගත කිරීමේ යන්ත්‍ර දෙකක් මිළදී ගැනීම සඳහා මිළගණන් කැඳවූවද අතර කිසිඳු සැපයුම්කරුවෙකු මිළගණන් ලබාදීමට කටයුතු කර නොතිබූ බැවින් ලංසු ලේඛන සැපයුම්කරුවන්ගේ ආකර්ශනය කරගැනීමට හැකි වන පරිදි නැවත සකස් කර මිළගණන් කැඳවීමට කටයුතු කරනු ඇත. | තේ කර්මාන්තශාලා නව තාක්ෂණයට අනුගත කිරීමේ ව්‍යාපෘතිය කඩිනමින් සම්පූර්ණ කළ යුතුය. |